චක්‍රලේඛ අංක 396

මගේ අංකය: 10/3/1,
සමාජසේවා දෙපාර්තමේන්තුව,
98, ඩී.එස්. සේනානායක මාවත,
කොළඹ 08.
1989 ජනවාරි මස 13 දින.

සියළුම දිසාපතිවරුන් වෙත,

## මහජනාධාර සහ ක්ෂය රෝග, ලාදුරු හා පිළිකා රෝගාධාර ගෙවීම

මගේ අංක: 10/3/1 හා 88.12.27 දිනැති ලිපියට අමතර වශයෙනි.

මෙම දෙපාර්තමේන්තුව මඟින් දැනට ගෙවන මහජනාධාර, ක්ෂයරෝග හා ලාදුරු රෝගාධාර 1989 ජනවාරි සිට වැඩිකර ඇති අතර දිළිඳු පිළිකා රෝගීන් සඳහාද ආධාර මුදල් ගෙවීමට කටයුතු කරන ලෙස මෙයින් දන්වනු ලැබේ.

### මහජනාධාර

(1) මහජනාධාර පහත සඳහන් පරිදි වැඩිකළ යුතුය.

| | වර්ගීකරණය | දැනට ගෙවනු ලබන මාසික දීමනාව රු: | ප්‍රතිශෝධිත මාසික දීමනාව රු: |
|---|---|---|---|
| 1. | තනි පුද්ගලයෙකුට | 40/= | 100/= |
| 2. | යැපෙන්නන් එක් අයෙකු සහිත පවුලකට | 60/= | 120/= |
| 3. | යැපෙන්නන් දෙදෙනෙකු සහිත පවුලකට | 75/= | 150/= |
| 4. | යැපෙන්නන් තිදෙනෙකු සහිත පවුලකට | 90/= | 180/= |
| 5. | යැපෙන්නන් සිව්දෙනෙකු සහිත පවුලකට | 105/= | 210/= |
| 6. | යැපෙන්නන් පස්දෙනෙකු සහිත පවුලකට | 125/= | 250/= |
| 7. | යැපෙන්නන් පස් දෙනෙකුට වැඩි පවුලකට | 150/= | 300/= |

(2)

### ක්ෂය රෝගාධාර හා ලාදුරු රෝගාධාර

| | වර්ගීකරණය | දැනට ගෙවනු ලබන මාසික දීමනාව රු: | ප්‍රතිශෝධිත මාසික දීමනාව රු: |
|---|---|---|---|
| I. | බාහිර ප්‍රතිකාර ලබන තනි පුද්ගලයෙකුට | 110/= | 250/= |
| II. | බාහිර ප්‍රතිකර ලබන යැපෙන්නන් සහිත පුද්ගලයෙකුට | 220/= | 500/= |
| III. | අභ්‍යන්තර ප්‍රතිකර ලබන යැපෙන්නන් සහිත පුද්ගලයෙකුට | 150/= | 300/= |

පිළිකා රෝගීන් සඳහා ද, ක්ෂය රෝගීන් හා ලාදුරු රෝගීන් සඳහා ගෙවීමට අනුමත කර ඇති නව ප්‍රමාණය අනුව ඒ ආකාරයටම ආධාර මුදල් ගෙවිය යුතුය. මෙම රෝගීන්ට ද වෛද්‍ය සහතික නිකුත් කිරීමට කටයුතු කරන ලෙස දැනටමත් සෞඛ්‍ය දෙපාර්තමේන්තුවට දන්වා ඇත. මේ සඳහා වාර්තා ලබා ගැනීමේ දී දැනට ක්ෂය රෝගීන් පිළිබඳව වාර්තා ලබාගැනීමට යොදා ගන්නා එස්.එස්.ටී.ටී. 3 [illegible]

භාවිතා කරනා එස්.එස්.පී.7 අංකයෙහි පත්‍රයක් යොදාගන්නා ලෙස මෙයින් දන්වමි. තවද, පිළිකා රෝගාධාර ගෙවීම සඳහා විශේෂ ආකෘති පත්‍රයක් සකස් කිරීම පිළිබඳ ඔබේ යෝජනා ඇත්නම් මා වෙත දන්වන්නේ නම් කෘතඥ වෙමි.

ක්ෂයරෝග, ලාදුරු හා පිළිකා රෝගීන් සඳහා වැඩි කරන ලද ප්‍රමාණය අනුව ආධාර මුදල් ගෙවීමේ දී රෝගියකු වෙනුවෙන් ගෙවිය හැකි උපරිම ආධාර පහත දැක්වෙන පරිදි ගණන් බැලිය යුතුය.

(3) පවුලේ ප්‍රධානියා බාහිර රෝගියෙකු නම්

| | රු: |
|---|---|
| පවුලේ ප්‍රධානියා බාහිර රෝගියෙකු නම් | 250/= |
| පවුලේ ප්‍රධානියාට | 100/= |
| පළමුවන යැපෙන්නාට | 100/= |
| වෙනත් යැපෙන්නන් එක් අයෙකුට | 50/= |
| ගෙවිය හැකි උපරිම ආධාර මුදල | 500/= |

(4) පවුලේ ප්‍රධානියා අභ්‍යන්තර රෝගියෙකු නම්,
පවුලේ ප්‍රධානියාට ගෙවිය නොහැක.

| | |
|---|---|
| පළමු යැපෙන්නාට | 100/= |
| වෙනත් යැපෙන්නන් එක් අයෙකුට | 50/= |
| ගෙවිය හැකි උපරිම ආධාර මුදල | 300/= |

(5) පවුලේ ප්‍රධානියා වන රෝගියෙකුගෙන් යැපෙන්නකු හෝ යැපෙන්නකු නොවන පවුලේ වෙනත් සාමාජිකයෙකු ඉහත සඳහන් රෝග වැළඳී බාහිර ප්‍රතිකාර ලබයි නම් ඉහත 1,2 ඡේදවල සඳහන් මුදලට අමතරව රු:250/= බැගින් ආධාර අතිරේක ආධාර මුදලක් ගෙවිය හැකිය.

(6) පවුලේ ප්‍රධානියා රෝගියෙකු නොවී ඔහුගෙන් යැපෙන්නකු හෝ යැපෙන්නකු නොවන පවුලේ සාමාජිකයෙකු ඉහත සඳහන් රෝග වැළඳී බාහිර ප්‍රතිකාර ලබයිනම් එවැනි එක් රෝගියෙකු වෙනුවෙන් රු:250/= බැගින් ආධාර මුදලක් පවුලේ ප්‍රධානියාට ගෙවිය හැකිය.

(7) ස්වේච්ඡා සංවිධාන මගින් පවත්වාගෙන යනු ළමා වැඩිහිටි නිවාසයක හෝ වෙනත් පුනරුත්ථායතනයක නැවති සිටින අයෙකු පිළිකා රෝගයෙන් පෙළෙන්නේ නම් ඔහුට ලැබෙන වෙනත් නඩත්තු ආධාර ආදිය නොසලකා රෝගියෙකු සඳහා ගෙවිය හැකි රු: 250/= ආධාර මුදල ගෙවිය යුතුය.

සමාජසේවා අධ්‍යක්ෂ

පිටපත : ප්‍රධාන ගණකාධිකාරී
: සියළුම සමාජසේවා සහකාර අධ්‍යක්ෂවරුන්
: ප්‍රාදේශීය උපදිසාපති වරුන්
: සමාජසේවා නිලධාරීන්.

ච/88/12.